# ඔබේ තටාකය සුරක්ෂිත කරගන්න, ඔබේ ළමුන් සුරක්ෂිත කරගන්න, පරීක්ෂණ ලේඛනය

2010-2011 දී නිව් සවුත් වේල්ස්හි අවුරුදු පහට අඩු වයසැති ළමුන් 12 දෙනෙක් ජලයේ ගිලුන අතර තවත් ළමුන් 64 දෙනෙකු ආසන්නව ජලයේ ගිලීම නිසා රෝහල්ගත කෙරුනි. අවුරුදු පහට අඩු වයසැති ළමුන් අතර සෑම වයස් කාණ්ඩයකටම වඩා ඉහලම ජලයේ ගිලීම් අනුපාතය ඇති අතර මෙයින් ආසන්න වශයෙන් 50%ක් පිහිනුම් තටාක වල ගිලීම් වේ.

අවුරුදු පහට අඩු වයසැති ළමුන්ගේ ජලයේ ගිලීම් සහ ආසන්න ගිලීම් අනුපාතයට ප්‍රධාන සාධකය ලෙස පවතින්නේ ප්‍රමාණවත් නොවූ තටාක වැටවල්ය. තටාක පෙදෙසට යාමට අවහිර කිරීම මගින් තටාක වැටවල් වැඩිදුර ආරක්ෂාව සපයයි.

සියලුම තටාක හිමියෝ තම තටාක වසර පුරා, විශේෂයෙන්ම ගිම්හානයට ලඟ මාස වලදී, නිබඳව පරීක්ෂා කර බැලිය යුතුය.

තටාක වැටවල් පිළිබඳ නීති ඔස්ට්‍රේලියාවේ සියලුම ප්‍රාන්ත සහ ප්‍රදේශ (territories) වල එකිනෙකට වෙනස් බව සහ මෙම පරීක්ෂණ ලේඛනය ආදල වන්නේ NSW සඳහා පමණක් බව කරුණාවෙන් දැනගන්න. *Swimming Pools Act 1992* (NSW) පනතට අවනත නොවන ඕනෑම අයෙකුට බරපතල දඬුවම් ලැබිය හැකිය.



වැඩිදුර තොරතුරු සඳහා කරුණාකර http://kidshealth.schn.health.nsw.gov.au වෙබ් අඩවියට පිවිස projects පටිත්ත යටතේ ඇති දියේ ගිලීම් වැළැක්වීමේ සබැඳිය ක්ලික් කරන්න.

kids health the children's hospital at Westmead Child Health Promotion Unit

ctcper the children's hospital at Westmead The Centre for Trauma Care, Prevention, Education and Research

NSW GOVERNMENT

Samuel Morris FOUNDATION

2012 නොවැම්බර

SPASA SWIMMING POOL & SPA ASSOCIATION OF NSW LIMITED

## ඔපඔඔබට බලපාන පිහිනුම් තටාක නීති

*Swimming Pools Act 1992* (NSW) පනතට අනුව පුද්ගලික පිහිනුම් තටාක හිමියන් ඔවුන්ගේ තටාක ඉඩමේ තිබෙන වාසස්ථාන ගොඩනැගිලි වලින් සහ ඉඩමට යාබදව ඇති යම් පොදු සහ පුද්ගලික ස්ථාන වලින් වෙන්කරන, ළමුන්ට ලඟාවිය නොහැකි (Child resistant) වැට වලින් නිරතුරුවම වටකර තැබීම අවශ්‍යවේ.

සාමාන්‍යයෙන් අනුකූල වැටක් යනු නියමිත ප්‍රමිතියට සෑදූ, තටාකය වටා බැඳි පැති හතරකින් යුත් වැටකි.

කෙසේ වුවත්, තටාකය ඉදිකල දිනය, ඔබේ තටාකය පිහිටා ඇති ඉඩමේ ස්වභාවය යන කරුණු මත නොයෙක් ප්‍රමිති සහ නිදහස් කිරීම් බලපානු ලැබේ. උදාහරනයක් ලෙස සීමිත අවස්ථා වලදී නිවස තටාකයෙන් වෙන්කිරීම පිණිස ළමුන්ට විවෘත කල නොහැකි දොරවල් සහ ජනේල අගුල් ඉදි කිරීමට අවසර දීමට ඉඩ ඇත.

ඔබේ තටාකයට අවශ්‍ය කුමණ අන්දමේ වැටක්ද යන්න සහ එය ඉදි කලයුතු ප්‍රමිතිය ගැන උපදෙස් සඳහා ඔබේ ප්‍රදේශයේ නගර සභාව අමතන්න.

## පිහිනුම් තටාක නාමලේඛනය

2013 ඔක්තෝබර 29 දින සිට සියලුම පිහිනුම් තටාක ප්‍රාන්ත තටාක නාමලේඛනයේ ලේඛනගත කල යුතුය.තටාක නාමලේඛනය 2013 අප්‍රේල් 29 දින සිට ලබාගත හැක. ලේඛනගත කිරීමේ ක්‍රියාවලියේ කොටසක් ලෙස තටාක හිමියෝ, තම දැනුමේ ප්‍රකාර ඔවුන්ගේ තටාක වැටවල් සම්බන්ධ නීති වලට අනුකූල වන බව සහතික කල යුතුය. තම පිහිනුම් තටාකය නාමලේඛනයේ ලියාපදිංචි නොකරන තටාක හිමියන්ට දඩ නියමවේ.

| | | |
|---|---|---|
| 2013 අප්‍රේල් 29 ට පසු - ඔබේ තටාකය ඔබ ප්‍රාන්ත තටාක නාමලේඛනයේ ලියාපදිංචි කළේද? | ☐ ඔව් | ☐ නැහැ - ඔබේ ප්‍රාදේශීය නගර සභාව හෝ පුද්ගලික සහතික කරන්නා අමතන්න. නැතහොත් NSW ප්‍රාන්ත රජයෙන් සපයා ඇති වෙබ් අඩවියට පිවිස ඔබේ පිහිනුම් තටාකය ලියාපදිංචි කරන්න. |

## පිහිනුම් තටාක පරීක්ෂාව

2014 අප්‍රේල් 29 දින සිට වාසස්ථාන දෙකකට වඩා පිහිටා ඇති සියලුම සංචාරක සහ ආගන්තුක නවාතැන් හෝ ඉඩකඩම්වල පිහිනුම් තටාක අවම වශයෙන් සෑම අවුරුදු තුනකටම වරක්ම පරීක්ෂාවට ලක් කල යුතුය.

*වාසස්ථානයක් යනු පදිංචි හෝ පාවිච්චි කරන හෝ එසේ වෙනම පදිංචි වීමට උචිතසේ ඉදිකර ඇති හෝ අනුවර්තිත කාමරයක් හෝ කාමර පෙලකි. town houses/ villas, apartments සහ මහල් නිවාස මීට අයත් වේ. නිවාස සංකීර්ණවල පොදු තටාක සහ තටාකයක් සහිත ප්‍රජා නිවාස සංකීර්ණ, කැරවෑන් උද්‍යාන , ආදිය.[Common pools in housing estates, community estates, caravan parks, camping grounds etc. with a pool.]*

සියලුම නගර සභා තම ප්‍රදේශයේ පිහිනුම් තටාක පරීක්ෂාව 2013 ඔක්තෝබර 29 වන දිනට පෙර පටන්ගත යුතුය. පළමු පරීක්ෂාව සඳහා $150 ක් දක්වාත්, දෙවනි පරීක්ෂණයක් අවශ්‍ය නම් (පළමු පරීක්ෂාවේදී දෝශ හඳුනාගතහොත්) ඒ සඳහා $100 ක් දක්වාත් අය කිරීමට ප්‍රදේශයේ නගර සභාවට හැකිය. වැඩිදුර තොරතුරු සඳහා ඔබේ ප්‍රදේශයේ නගර සභාව අමතන්න.

2014 අප්‍රේල් 29 දින වනවිට පිහිනුම් තටාකයක් සහිත සියලුම වාසස්ථාන වලට, ඒවා බදු දීමට හෝ විකිණීමට පෙර, වලංගු අනුකූලතා සහතිකයක් (certificate of compliance) තිබිය යුතුය.

2012 මැයි 1 දින සිට තටාක හිමියන්ට අනකූලතා සහතිකයක් නිකුත් කරගැනීම සඳහා තටාක වැට පරීක්ෂා කිරීමට තම ප්‍රදේශයේ නගර සභාව හෝ වරලත් සහතිකකරන්නෙක් යොදවා ගත හැක.

අනකූලතා සහතිකය අවුරුදු තුනක කාලයක් වලංගු වේ.

## රොඩු ඉවත් කරන පෙට්ටි (skimmer boxes)

තටාකවල රොඩු ඉවත් කරන පෙට්ටිය, විශේෂයෙන්ම පරන ‘පොටී‘ තාලයේ (‘potty’ style) රොඩු ඉවත් කරන පෙට්ටි, උඩ වාඩිවීමෙන් සිදුවිය හැකි බරපතල අභ්‍යන්තර තුවාල නිසා 1993 සිට NSW ප්‍රාන්තයේ සියලුම තටාක සහ spa සඳහා ආරක්ෂාදායක රොඩු ඉවත් කරන පෙට්ටි සවිකර තිබීම අවශ්‍යවේ.

| | | |
|---|---|---|
| ඔබේ රොඩු ඉවත් කරන පෙට්ටියට නිත්‍ය ගෝලාර්ධ හැඩය ඇති ආරක්ෂිත පියනක් සහ ආයුධයක් භාවිතා කිරීමෙන් පමනක් ඉවත් කලහැකි ආරක්ෂිත අද්දර වැටියක් (skirt ) තිබේද? | ☐ ඔව් | නැහැ- – පෙරහන දොරටුවට ආරක්ෂාදායක පියනක් සවිකරන්න.වීදුරුතන්තු (fibreglass) තටාක නිෂ්පාදකයන් සහ අලුත්වැඩියාකරන්නන්ට මේ අලුත්වැඩියාව කිරීමට පුලුවන (ඔබට Yellow Pages මගින් මොවුන්ව සොයා ගැනීමට පුලුවන). එමෙන්ම පරණ තාලයේ රොඩු ඉවත් කරන පෙට්ටිය සඳහා අඩු මිළ පරිවර්තන කට්ටලයක් සැපයීමට හැකියාව ඔබේ ප්‍රදේශයේ තටාක සපයන්නාට තිබෙන්නට පුලුවන. |



අනතුරුදායක රොඩු පාදන පෙට්ටිය



ආරක්ෂාදායක වෙනස්කල රොඩු පාදන පෙට්ටිය

## අලුත් පිහිනුම් තටාක

*Work Health and Safety Regulations 2011* (Cth) විධිවිධාන අනුව කැණීම් වැඩ වලදී සෞඛ්‍යයට සහ ආරක්ෂාවට ඇතිවිය හැකි අවදානම මගහැරීම පිණිස සියලුම අලුත් තටාක ගොඩනගන විට එවා වටා තාවකාලික වැටක් බැදීම අවශ්‍යවේ. ළමුන් හිස් තටාක තුලට වැටීම හෝ වැස්සට පසු තටාකයේ ජලය ඇත්නම් එහි ගිලීම වැලැක්වීම මේ අවදානම් වලට අයත් වේ.

| | | |
|---|---|---|
| ඔබේ තටාකය ගොඩනගද්දී එය වටා තාවකාලික වැටක් ඔබ ඉදි කර තිබේද? | ☐ ඔව් | ☐ නැහැ- – තාවකාලික වැටක් ඉදි කරන්න. |
| අලුත් පිහිනුනම් තටාකයක් ගොඩනැගීමට පෙර ඔබේ ප්‍රාදේශීය නගර සභාවෙන් ඔබ අනුමතිය ලබාගත්තාද? | ☐ ඔව් | ☐ නැහැ- ඔබේ ප්‍රාදේශිය නගර සභාව හෝ පුද්ගලික ගොඩනැගිලි සහතිකකරන්නා අමතන්න. |
| ඔබේ ස්ථිර වැට පිහිටුවන්නේ කොතැනද යන්න ගැන ඔබ ඔබේ ප්‍රාදේශිය නගර සභාව සමග කතා කලාද? | ☐ ඔව් | ☐ නැහැ- ඔබේ ස්ථිර තටාක වැට පිහිටුවන ස්ථානය නගර සභාවේ නිර්ණායක වලට අනුකුල වනබව සහතික කරගැනීම පිණිස ඔබේ ප්‍රාදේශිය නගර සභාව අමතන්න. |
| ස්ථිර අනුකුල වැට ඉදිකලාට පසු හැකි ඉක්මනින් එය ඔබේ ප්‍රාදේශිය නගර සභාව හෝ පුද්ගලික ගොඩනැගිලි සහතිකකරන්නා විසින් අවසාන පරීක්ෂාවකට ලක් කලාද? | ☐ ඔව් | ☐ නැහැ- අවසාන පරීක්ෂණය සඳහා ඔබේ ප්‍රාදේශිය නගර සභාව හෝ පුද්ගලික ගොඩනැගිලි සහතිකකරන්නා අමතන්න. |

## තටාක අභ්‍යන්තර වැටේ උස - මායිම් වැටවල් සඳහා ඊට ඇති වෙනමම කොටස බලන්න

| | | |
|---|---|---|
| ඔබේ තටාක වැට නිමි බිම් මට්ටමේ සිට අවම වශයෙන් බිමෙන් මීටර 1.2ක් ඉහලින් පිහිටා තිබේද? | ☐ ඔව් | ☐ නැහැ- බලපත්‍රලත් ගොඩනගන්නෙක් , තටාක තාක්ෂණිකයෙක් හෝ වැට ඉදිකිරීමේ කොන්තරාත්කරුවෙක් වහාම අමතන්න. |

## තටාක වැට - නැගිය නොහැකි කලාපය

| | | |
|---|---|---|
| ගස්, පඳුරු හෝ බාබෙකියු, පැල පෝච්චි, සෙල්ලම් බඩු, ඉනිමං සහ පුටු වැනි වෙනත් දේවල් සෙන්ටිමීටර 90ක් වූ නැගිය නොහැකි කලාපයට පිටතින් ඇතැයි ඔබ සහතික කරගත්තාද? (තටාක වැටේ පිටපැත්තේ මුදුනේ සිට පොළොව දිසාවට ආරුක්කු වනසේ චාප හැඩයට මැනීමෙන්) | ☐ ඔව් | ☐ නැහැ- ළමයෙකුට වැටෙන් උඩට නැගීමට මෙම දේවල් පාවිච්චි කිරීමට නොහැකිවනු පිණිස ගස්, පඳුරු හෝ බාබෙකියු, පැල පෝච්චි, සෙල්ලම් බඩු, ඉනිමං සහ පුටු වැනි අනික් දේවල් සෙන්ටිමීටර 90ක් වූ නැගිය නොහැකි කලාපය ඇතුලත නොතිබිය යුතුය. |

තටාක වැටේ ඇතුල් පැත්තේ සෙන්ටි මීටර 30ක් වන නැගිය නොහැකි කලාපය තුල ස්ථිර ගොඩනැගිලි නොතිබිය යුතුය. ගරාජ, පර්ගෝලා, රෙදි වැල, බෝට්ටු මඩු, බෑවුම් මග/පාරු (ramp/pontoon) හෝ මඩු වැනි තටාක නොවන ගොඩනැගිලි තටාක ය පිහිටි පෙදෙස ඇතුලත ඉදිකිරීමට අවසර නැත.






## තටාක වැට - සිරස් කපොලු

| | | |
|---|---|---|
| වැටේ සිරස් දඬු තිබේනම් එම දඬු අතර කපොලු සෙන්ටි මීටර 10කට වඩා නොවැඩිද?<br>*සංලක්ෂය: දණ්ඩෙහි ශුනම්‍ය තාවය පිණිස උපරිම සෙන්ටි මීටර 10ක පරතරය සහ සාමාන්‍ය මිනුම සෙන්ටි මීටර 9කට අඩුවෙන්* | ☐ ඔව් | ☐ නැහැ- බලපත්‍රලත් ගොඩනගන්නෙක් , තටාක තාක්ෂණිකයෙක් හෝ වැට ගොඩනැගීමේ කොන්තරාත්කරුවෙක් වහාම අමතන්න. |

## තටාක වැට - නැගිය හැකි තිරස් දඬු

| | | |
|---|---|---|
| වැටේ තිරස් දඬු අවම වශයෙන් එකිනෙකට සෙන්ටි මීටර 90ක් ඇතින් තිබේද? | ☐ ඔව් | ☐ නැහැ- බලපත්‍රලත් ගොඩනගන්නෙක් , තටාක තාක්ෂණිකයෙක් හෝ වැට ඉදිකිරීමේ කොන්තරාත්කරුවෙක් වහාම අමතන්න. |

## තටාක වැට - වැටේ පතුලේ කපොල්ල

| | | |
|---|---|---|
| වැටේ පතුලේ කපොල්ල නිමි බිම් මට්ටමෙන් සෙන්ටි මීටර 10කට නොවැඩිද? | ☐ ඔව් | ☐ නැහැ- බලපත්‍රලත් ගොඩනගන්නෙක් , තටාක තාක්ෂණිකයෙක් හෝ වැට ඉදිකිරීමේ කොන්තරාත්කරුවෙක් වහාම අමතන්න. |





| | | |
|---|---|---|
| **තටාක වැට සහ ගේට්ටුව - නඩත්තු කිරීම** | | |
| වැටේ සියලු යතුරු ඇණ, ඉස්කුරුප්පු ඇණ සහ බැඳුම් තදින් සහ නිසි ලෙස වැඩ කරන තත්ත්වයෙන් තිබේද? | ☐ ඔව් | ☐ නැහැ- - බුරුල් යතුරු ඇණ, ඉස්කුරුප්පු ඇණ සහ බැඳුම් තද කල යුතුයි නැතිනම් අලුත් කල යුතුයි. |
| ඉබේ වැසෙන ගේට්ටු සරනේරු, අගුල් සහ තරංක වලට ඔබ ලිහිසි තෙල් හෝ සිලිකන් විදිනවාද? | ☐ ඔව් | ☐ නැහැ- ඔබේ තටාක ගේට්ටුව සහ වැට නඩත්තු කරන අන්දම ගැන ලිඛිත උපදෙස් තටාක වැට නිෂ්පාදකයන් විසින් ඔබට සැපයිය යුතුය. ඉබේ වැසෙන ගේට්ටු හෝ ඉබේ තරංක වැටෙන ගේට්ටුවල හටගන්නා බොහොමයක් දෝෂ වැළැක්වීමට උපකාරී විය හැකි විධිමත් දුනු අලුත් කිරීම සහ ඉබේ වැසෙන ගේට්ටු සරනේරු, අගුල් සහ තරංක වලට විධිමත්ව ලිහිසි තෙල් හෝ සිලිකන් විදීම මිට ඇතුලත් වේ. |
| **තටාක වැට - ගේට්ටුවේ තරංක යෙදුම සවිකරන තැන** | | |
| ඔබේ තටාක ගේට්ටුවේ ආවරණය නොකල තරංක යෙදුම අවම වශයෙන් බිම් මට්ටමෙන් සෙන්ටි මීටර 150කට ඉහලින් සවිකර තිබේද? | ☐ ඔව් | ☐ නැහැ- ඔබේ තරංක යෙදුම බිම් මට්ටමෙන් සෙන්ටි මීටර 150කට වඩා පහතින් ඇත්නම් එය තටාක වැටේ ඇතුල් පැත්තේ, ගේට්ටුවේ මුදුනට අවම වශයෙන් සෙන්ටි මීටර 15කට පහලින්, තරංකය වටා අවම වශයෙන් සෙන්ටි මීටර 45ක අරය සහිත ආවරණයක් සහිතව සවිකල යුතුය. |
| **හෘද-පුප්ඵුසීය යළි පණ ගැන්වීමේ (CPR) සළකුණ** | | |
| හොද තත්ත්වයෙන් යුත්, මීටර 3ක දුර සිට කියවීමට හැකි CPR සළකුණක් ඔබේ තටාකය පෙදෙසේ තිබේද?<br><br>*සංලක්ෂය: : මැකීයාම සිදුවුවහොත් CPR සළකුණ කලින් කලට අලුත් කිරීම අවශ්‍ය වියහැක.* | ☐ ඔව් | ☐ නැහැ- ඔබේ ප්‍රදේශයේ තටාක වෙළඳසලෙන්, නගරසභාවෙන් හෝ St John Ambulance, Australian Red Cross හෝ Royal Life Saving Society වැනි ප්‍රජා සංවිධානයකින් CPR සළකුණක් මිලට ගෙන සවිකරන්න. |

| | | |
|---|---|---|
| **තටාක වැට, ඉබේ වැසෙන සහ ඉබේ තරංක වැටෙන යෙදුම්** | | |
| ඔබේ තටාක ගේට්ටුව ඇරෙන්නේ පිටපැත්තටද (තටාකයෙන් ඈතට)? | ☐ ඔව් | ☐ නැහැ- තටාක ගේට්ටුව පිටපැත්තට ඇරෙන පරිදි නැවත සවිකල යුතුය (තටාක පෙදෙසින් ඉවතට) |
| ඔබේ තටාක ගේට්ටුව විවෘතව තිබෙන විට බලය යොදා වැසීම අවශ්‍ය නොකර ඉබේ වැහෙනවාද? | ☐ ඔව් | ☐ නැහැ- - අලුත් අගුලක් සහ වැසීමේ යෙදුමක් (closing device ) සවිකරන තෙක් ස්ථිරව වසා තැබිය යුතුය. ඉබේ වැහෙන සහ ඉබේ තරංක වැටෙන යෙදුම් සෑම තටාක වෙළඳසලකින් සහ ලෝහ බඩු වෙළඳසලකින්ම පාහේ මිලදී ගත හැකි අතර ඒවා සවිකිරීම සෑහෙන තරමට පහසු කාර්යයකි. |
| ඔබේ තටාක ගේට්ටුව වැහෙන විට ඉබේ අගුල් වැහෙනවාද (ඉබේ තරංක වැටීම) ? | ☐ ඔව් | |
| ඔබේ තටාක ගේට්ටුව කවරදාකවත් මුක්කුවක් පාවිච්චි කර විවෘතව නොතබන ලෙස නිශ්චය කරගන්නවාද? | ☐ ඔව් | ☐ නැහැ- සෑම විටම ගේට්ටුව වහන්න, කවරදාකවත් මුක්කුවක් පාවිච්චි කර ගේට්ටුව විවෘතව නොතබන්න. |
| **මායිම් වැට තටාක වැටේ කොටසක් ලෙස භාවිතා කිරීම** | | |
| ඔබේ මායිම් වැටේ ඇතුල්පැත්තේ තිරස් දඬු ඇත්නම්, ඒවා  තිබෙන්නේ සෙන්ටිමීටර 90ක් වු නැගිය නොහැකි කලාපයෙන් පිටතද? (තටාක වැටේ ඇතුල්පැත්තේ මුදුනේ සිට පොළොව දිසාවට ආරුක්කු වනසේ චාප හැඩයට මැනීමෙන්) | ☐ ඔව් | ☐ නැහැ- -  අනුකූල විසඳුමක් ඔබට සපයා ගැනීම සඳහා බලපත්‍රලත් ගොඩනගන්නෙක් , තටාක තාක්‍ෂණිකයෙක් හෝ වැට ඉදිකිරීමේ කොන්තරාත්කරුවෙක් අමතන්න. |
| **ළමුන්ට විවෘත කල නොහැකි ජනේල - බිම සිට සෙන්ටි මීටර 180කට  වඩා අඩු ඉහලින් ජනෙල් පඩි** | | |
| 2008 සැප්තැම්බර 1 වෙනි දිනට පෙර නිමවන ලද පිහිනුම් තටාක වල, තටාක වැටේ කොටසක් ලෙස ළමා-සුරක්‍ෂිත (child-safe) ජනේල තිබිමට පුලුවන. ළමා-සුරක්‍ෂිත ජනේල ඇතුලු, පරන තටාක සඳහා වු අවශ්‍යකතාවයන්  ළමා-ප්‍රතිරෝධී (child-resistant ) ජනේල ඇතුලු, අලුත් තටාක සඳහා වු අවශ්‍යකතාවයන්ගෙන් වෙනස්ය. තටාක වැට වල කොටසක් වන ජනේල නඩත්තු කිරීම අදාල ප්‍රමිතියට අනුකූලව සිදුකර නැතිනම් , ඔබට නුතන ළමා-ප්‍රතිරෝධී ජනේල අවශ්‍යකතාවන්ට අවනතවීමට සිදුවනු ඇත. වෙනස්වීම් කරනලද හෝ යළි ගොඩනංවන ලද වැටවල් සඳහාද නුතන ළමා-ප්‍රතිරෝධී ජනේල අවශ්‍යකතාවන්ට අවනතවීමට සිදුවනු ඇත. කරුණාකර ඔබේ ප්‍රදේශයේ නගරසභාවෙන් පිරික්සා බලන්න. | | |
| තටාක වැටක කොටසක් ලෙස **ළමා-සුරක්‍ෂිත** ජනේල ඔබට තිබේනම් ඒවා සෙන්ටි මීටර 10කට වඩා විවෘතවීම වළක්වනු පිණිස අගුල් යෙදුමක් හෝ ආරක්‍ෂක තිරයක් සවිකර තිබේද ? | ☐ ඔව් | ☐ නැහැ- - ළමා-සුරක්‍ෂිත ජනේල  සවිකිරීමට තිබි නිදහස දැන් බල පවත්වන්නේ නැත. නුතන ළමා ප්‍රතිරෝධී ජනේල අවශ්‍යකතා වලට ඔබ අනුකූල විය යුතුය. |
| තටාක වැටක කොටසක් ලෙස  **ළමා-ප්‍රතිරෝධී** ජනේල ඔබට තිබේනම්, ජනේලයේ  විවෘත කළහැකි කොටස ස්ථිරව සවිකල දඬු හෝ දැල් තිරයකින් ආවරණය කර තිබේද? | ☐ ඔව් | ☐ නැහැ- ජනේලයේ  විවෘත කළහැකි කොටස ආවරණය කිරීමට  දඬු හෝ දැල් තිරයක් සවි කරන්න (උපරිම කපොල්ල සෙන්ටි මීටර 10). දඬු සහ දැල් තිර ඔබේ ප්‍රදේශයේ ලෝහ බඩු වෙළඳසලෙන් මිලට ගත හැක. නමුත් ඔබ ඔබේ ප්‍රදේශයේ නගර සභාවෙන් හෝ බලපත්‍රලත් ගොඩනැගිලිකරුවෙකුගෙන්ද උපදෙස් ලබා ගත යුතුයි. |

| | | |
|---|---|---|
| **ළමුන්ට විවෘත කල නොහැකි දොරවල්** | | |
| සමහර පරණ පිහිනුම් තටාකවල තටාක වැටේ කොටසක් ලෙස දොරවල් තිබීමට පුලුවන. අලුත් තටාක ඉදි කිරීමේදී හෝ තටාක වැට වෙනස් කිරීමේදී හෝ යළි ඉදිකිරීමේදී තව දුරටත් මීට අවසර නොලැබේ. | | |
| තටාක වැටේ කොටසක් ලෙස දොරක් ඔබට තිබේනම් එය ඉබේ වැහෙනවාද? | ☐ ඔව් | ☐ නැහැ-<br>ළමා-සුරක්ෂිත දොරවල් සවිකිරීම සඳහා වූ නිදහස් කිරීම තවදුරටත් බල නොපවත්වයි. ඔබේ පිහිනුම් තටාකය සතර දිසාවෙන්ම වටකරන වැටක් ඉදිකිරීමට ඔබට සිදු වනු ඇත. කරුණාකර ඔබේ නගර සභාවෙන් පිරික්සන්න. |
| තටාක වැටේ කොටසක් ලෙස දොරක් ඔබට තිබේනම් එය ඉබේ තරංක වැටෙනවාද? | ☐ ඔව් | |
| තටාක වැටේ කොටසක් ලෙස දොරක් ඔබට තිබේනම් එහි තරංක යෙදූම අවම වශයෙන් බිමට සෙන්ටි මීටර 150ක් එපිටින් සවිකර තිබේද, එය දොරේ දෙපැත්තෙන්ම ක්‍රියාකරවිය හැකිද? | ☐ ඔව් | |
| තටාක වැටේ කොටසක් ලෙස දොරක් ඔබට තිබේනම්, සෙන්ටි මීටර 1කට වඩා පළලින් වැඩි පාපුවරු එම දොරේ හෝ බිමෙන් සෙන්ටි මීටර 100කට වඩා උඩින් දොර රාමුවේ නැතැයි ඔබ සහතික කරගත්තාද? | | |
| තටාක වැටේ කොටසක් ලෙස දොරක් ඔබට තිබේනම් එහි සුරතල් සතුන්ගේ දොරවල් නැතැයි ඔබ සහතික කරගත්තාද? | ☐ ඔව් | |
| **පොළොවට උඩින් ඇති තටාක සහ සුලං පුරවන ලද තටාක** | | |
| පොළොව උඩ තටාකයක් ඔබ සතු නම් , එය වටා වැටක් තිබේද? | ☐ ඔව් | ☐ නැහැ- ළමා-ප්‍රතිරෝධී වැටක් සවිකරන්න. |
| සෙන්ටි මීටර 30 කට වඩා ජලය පිරවිය හැකි සුලං පුරවනලද හෝ පහසුවෙන් ගෙනයාහැකි තටාකයක් ඔබට තිබේනම් එයට වැටක් තිබෙනවාද? | ☐ ඔව් | |



✗



✓

| Spa තටාක | | |
|---|---|---|
| ඔබේ spa තටාකය වටා වැටක් බැඳ තිබේද? | ☐ ඔව් | ☐ නැහැ- ළමා-ප්‍රතිරෝධී වැටක් ඉදි කරන්න, නැතහොත් අගුල් දැමිය හැකි ළමා-සුරක්ෂිත ව්‍යුහයකින් (දොරක්, පියනක්, ගරාදි වැටක් හෝ දැලක් (grille or mesh) වැනි දෙයක්) spa තටාකය පාවිච්චි නොකරන වේලාවල් වලදී එසා සුරක්ෂිතකර ඇතැයි ඔබ සහතික කල යුතුයි. |
| **අනික් පිරික්සුම්** | | |
| සියලුම විදුලි අවයව කොටස් සහ පොම්ප, විදුලි ආරක්ෂක අවශ්‍යතා වලට අනුකූලද ඒවා නිසි ලෙස ආවරණය කර ඇත්ද යන්න ඔබ පිරික්සා බැලුවාද? | ☐ ඔව් | ☐ නැහැ- - ඔබේ spa තටාකයේ අනිවාර්ය විදුලි ආරක්ෂක අනුමති අංකය හෝ නියාමන අනුමති මුද්‍රාව ( electrical safety approval number or a Regulatory Compliance Mark) සළකුණු කර ඇතිදැයි පිරික්සන්න. ඔබේ ඔස්ට්‍රේලියානු ප්‍රාන්තය හෝ ප්‍රදේශය සඳහා වූ කැපිටල් අකුර (උදාහරණයක් ලෙස NSW සඳහා N) සහ සහතිකයේ අංකය මේ සළකුණට සාමාන්‍යයෙන් අයත් වේ. |
| හොඳ තත්ත්වයෙන් යුත්, මීටර 3ක දුර සිට කියවීමට හැකි CPR සළකුණක් ඔබේ spa තටාකය ළඟ තිබේද? | ☐ ඔව් | ☐ නැහැ- ඔබේ ප්‍රදේශයේ තටාක වෙළඳසලෙන්, නගර සභාවෙන් හෝ St John Ambulance, Australian Red Cross හෝ Royal Life Saving Society වැනි ප්‍රජා සංවිධානයකින් CPR සළකුණක් මිලට ගෙන සවිකරන්න. |









| බදුකරුවෝ |
|---|
| පිහිනුම් තටාකය නඩත්තුකිරීමේ වගකීම් සියලුම බදු ගිවිසුම්වල අඩංගු විය යුතුය. කිසියම් හානි සිදුවී ඇත්නම් සහ අලුත්වැඩියා කිරීම් අවශ්‍යනම් ඒ බව කුලී නිවැසියා විසින් කුලී ගෙවල් හිමියාට දැන්විය යුතුය. කුලී ගෙවල් හිමියා හෝ නියෝජිතයා සම්බන්ධ කරගැනීමට නොහැකිනම් හෝ ඔවුන් සාධාරන කාල සීමාවක් ඇතුලත ඉතා හදිසි අලුත්වැඩියා කිරීම් නොකරයිනම් , ගේදොර ඉඩමේ අනාරක්ෂිත බවට හේතුවිය හැකි ඉතා හදිසි අලුත්වැඩියා කුලී නිවැසියා විසින් කල හැක (පිහිනුම් තටාක වැටේ දෝෂ මීට ඇතුලත් වේ) . |